# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1182/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திக<br>Date | 18/07/2024<br>පැය 0540 | | |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - බිංගිරිය පොලිස් වසම.

2024.07.17 වන දින සවස් කාලයේ බිංගිරිය පොලිස් වසමේ ඉහල කඩිගමුව ප්‍රදේශයේ දී තියුණු ආයුධයකින් පහරදීමක් හේතුවෙන් බරපතල තුවාල ලැබූ කාන්තාවක් බිංගිරිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට බිංගිරිය පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 45 ක් වන ඉහල කඩිගමුව, කඩිගමුව ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මරණකාරිය සහ සැකකරු බිරිඳ සහ ස්වාමි පුරුෂයා වන අතර, සැකකරු බීමත්ව නිවසට පැමිණි බිරිඳට පහරදෙන බැවින් ඇය සති දෙකකට පමණ පෙර තම දෙමව්පියන්ගේ නිවසට ගොස් ඇත. ඇය එම නිවසේ සිට දිය නෑමට ළිඳට යමින් සිටියදී සැකකාර පුරුෂයා විසින් තියුණු ආයුධයකින් ගෙල කපා මෙම ඝාතනය සිදුකර ඇති අතර, සැකකරු සිද්ධියෙන් පසු ප්‍රදේශයෙන් පලා ගොස් ඇත. මෘත ශරීරය බිංගිරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර බිංගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. මනුෂ්‍ය ඝාතනයක් - මහවෙල පොලිස් වසම.

2024.07.17 වන දින දහවල් කාලයේ මහවෙල පොලිස් වසමේ මිල්ලවාන ප්‍රදේශයේ දී තියුණු ආයුධයකින් පහරදීමක් හේතුවෙන් පුද්ගලයෙකු මියගොස් ඇති බවට මහවෙල පොලිස් ස්ථානයට 119 තොරතුරු මධ්‍යස්ථානයෙන් ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 46 ක් වන පහලගම, මිල්ලවාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු තම ඉඩමේ වැට සකස් කරමින් සිටියදී අසල ඉඩමේ හිමිකරු සමග ඇතිකර ගත් ආරවුලක් දුරදිග යාම හේතුවෙන් කැත්තකින් පහරදී මෙම ඝාතනය සිදුකර ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශනයේදී අනාවරණය වී ඇත. ඝාතනය සිදුකරන ලද වයස අවුරුදු 55 ක් වන ඉහත ප්‍රදේශයේ පදිංචි සැකකරු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන ඇත. මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දැරියක් ළිඳකට දමා ඝාතනය කිරීමක් - රුවන්වැල්ල පොලිස් වසම.

2024.07.17 වන දින උදෑසන කාලයේ රුවන්වැල්ල පොලිස් වසමේ යටියන්තොට ප්‍රදේශයේ පදිංචි දැරියක් නිවස අසල පිහිටි ළිඳකට වැටී මිය ගොස් ඇති බවට රුවන්වැල්ල පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මිය ගිය දැරිය වයස අවුරුදු 04 මාස 10 ක් පමණ වූ කිරිපෝරුව වත්ත, යටියන්තොට ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෙම සිදුවීම 2024.07.16 වන දින රාත්‍රී 11.00 ත් පසු දින අළුයම 5.30 ත් අතර කාලයේ සිදුව ඇති අතර, දැරියගේ මව විසින් දැරිය ළිඳට දමා ඝාතනය කර ඇති බවට පොලිසිය සිදුකළ විමර්ශණයේදී අනාවරණය වී ඇත. මියගිය දැරියගේ මව ගොළු කාන්තාවක් වන අතර, ඇය අසනීප තත්ත්වයෙන් පසුවූ බැවින් කරවනැල්ල රෝහලේ පොලිස් ආරක්ෂාව යටතේ ප්‍රථිකාර ලබමින් සිටී. මෘත ශරීරය මහේස්ත්‍රාත් පරීක්ෂණය සහ පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාර දී ඇත. රුවන්වැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවන් 04 දෙනෙකු සහ සැකකාරියක් අත්අඩංගුවට - මැල්සිරිපුර පොලිස් ස්ථානය.

2024.07.17 වන දින සවස් කාලයේ මැල්සිරිපුර නගරයේ දී මැල්සිරිපුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීම් සිදුකර යතුරු පැදි 03 කින් ගමන් කරමින් සිටි සැකකරුවන් 04 දෙනෙකු සහ සැකකාරියක් **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 100 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 100 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11 මිලිග්‍රෑම් 900 ක්, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 150 ක් සහ අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටියදී** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 20, 23, 27 හා 29 වයස්වල පසුවන බොරුල්ල, පන්ලියද්ද හා දඹුල්ල ප්‍රදේශවල පදිංචිකරුවන් වන අතර, සැකකාරිය වයස අවුරුදු 19 ක් වන බොරුල්ල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මැල්සිරිපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තලංගම පොලිස් ස්ථානය.

2024.07.17 වන දින උදෑසන කාලයේ තලංගම පොලිස් වසමේ තලවතුගොඩ ප්‍රදේශයේදී තලංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 600 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 53 ක් වන තලවතුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තලංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. බුරුත දැව ප්‍රවාහනය කළ සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට - ඉලුප්පකඩවෛ පොලිස් ස්ථානය.**

2024.07.17 වන දින උදෑසන කාලයේ ඉලුප්පකඩවෛ පොලිස් වසමේ 04 කණුව ප්‍රදේශයේදී ඉලුප්පකඩවෛ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **බුරුත දැව කඳන් 05ක් කැබ් රථයකින් ප්‍රවාහනය කළ සැකකරුවන් 08 දෙනෙකු යතුරු පැදියක්ද සහ යාන්ත්‍රික කියතක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 30 ත් 51 ත් අතර වයස්වල පසුවන මල්ලාවි, තුනුක්කායි හා මාන්කුලම් ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

ඉලුප්පකඩවෛ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. නීති විරෝධී මත්පැන් සමග සැකකරුවෙකු අත්අඩංගුවට - රාගම පොලිස් ස්ථානය.**

2024.07.17 වන දින රාත්‍රී කාලයේ රාගම පොලිස් වසමේ කපුවාවැව ප්‍රදේශයේදී රාගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 162 ක් සමග සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 55 ක් වන රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

රාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08. සැකකටයුතු මරණයක් - හිදෝගම පොලිස් වසම.**

2024.07.17 වන දින සවස් කාලයේ හිදෝගම පොලිස් වසමේ දිවුල්වැව ප්‍රදේශයේ නිවසක මිදුලේ කාන්තාවක් සැකකටයුතු ලෙස වැටී මියගොස් ඇති බවට හිදෝගම පොලිසියට ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 65 ක් වන දිවුල්වැව, හිදෝගම ලිපිනයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය හදිසි මරණ පරීක්ෂණය සිදුකර අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. හිදෝගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09. මාරක රිය අනතුරක් - තිහගොඩ පොලිස් වසම.**

2024.07.17 වන දින උදෑසන කාලයේ තිහගොඩ පොලිස් වසමේ මාතර හක්මණ මාර්ගයේ යටියන ප්‍රදේශයේ ඉන්ධනහල අසලදී බස් රථයකට ඉන්ධන පුරවා ගැනීමෙන් අනතුරුව හක්මණ දෙසට ධාවනය කිරීමේදී එම ඉන්ධනහල අසලදී පදිකයෙකුගේ ගැටී එම බස් රථයට යට වීමෙන් මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 77ක් වූ පහළ අපරැක්ක ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර තිහගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - වැල්ලවත්ත පොලිස් වසම.

2024.07.17 වන දින උදෑසන කාලයේ වැල්ලවත්ත පොලිස් වසමේ ගාල්ල කොළඹ මාර්ගයේ ඩබ්.ඒ. සිල්වා මාවත හන්දියේදී මොරටුව දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ පුද්ගලික බස් රථයක් මාර්ගය හරහා පදික මාරුව මතින් ගමන් කරමින් සිටි පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා කළුබෝවිල රෝහලට ඇතුලත් කිරීමෙන් අනතුරුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 74ක් වූ රාවතාවත්ත, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අනතුර සම්බන්ධයෙන් බස් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 11. මාරක රිය අනතුරක් - වෙන්නප්පුව පොලිස් වසම.

2024.07.17 වන දින උදෑසන කාලයේ වෙන්නප්පුව පොලිස් වසමේ පුත්තලම කොළඹ මාර්ගයේ වයික්කාල ප්‍රදේශයේදී හලාවත දෙස සිට කොළඹ දෙසට ධාවනය වූ යතුරු පැදියක් මාර්ගය හරහා ගමන් කරමින් සිටි පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ කාන්තාව මීගමුව රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 68 ක් වූ බෝලාන, වයික්කාල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය පශ්චාත් මරණ පරීක්ෂණය සිදුකර ඥාතීන්ට භාර දී ඇත. අනතුර සම්බන්ධයෙන් යතුරු පැදිකරු අත්අඩංගුවට ගෙන ඇති අතර වෙන්නප්පුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**